රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 07/2020(III)

මගේ අංකය : EST-06/04/LOANS/4072
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2020.06.10

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>නව කොරෝනා වෛරසය හේතුකොට ගෙන, උද්ගතව ඇති තත්ත්වය සැලකිල්ලට ගෙන රජයේ නිලධරයන්ට සහන සැලසීම</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2020.03.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2020 හා 2020.04.04 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2020(II) කෙරෙහි අවධානය යොමු කරවමි.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2020(II)හි 02 වගන්තිය අනුව සියලුම රාජ්‍ය නිලධරයන්ට වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල II කොටසේ අත්තිකාරම් ගිණුම්වල "රජයේ නිලධරයන්ට අත්තිකාරම්" යන ශීර්ෂය යටතේ ලබා දී ඇති ණය වෙනුවෙන් ඔවුන්ගේ වැටුපෙන් අයවිය යුතු ණය වාරික සහ ණය පොලිය අය කිරීම නැවත දැනුම්දෙන තුරු අත්හිටුවීමට ගත් තීරණය 2020 ජූනි මස වැටුපේ සිට අදාළ නොවන අතර පෙර පරිදි එම ණය වාරික සහ පොලිය අදාළ නිලධරයන්ගේ වැටුපෙන් අය කළ යුතුය.

03. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව නිකුත් කෙරේ.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය